දෙපාර්තමේන්තු නියෝග 01/2024(i)

මගේ අංකය : DAPH/AD/16/02/05/2024
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
පේරාදෙණිය.
2024.09. 30

සියලුම අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්
සියලුම අධ්‍යක්ෂවරුන්
සියලුම ආයතන භාර නිලධාරීන්

<u>පාඩු හා අලාභහානි සම්බන්ධයෙන් කටයුතු කිරීම</u>

උක්ත කරුණ සම්බන්ධයෙන් නිකුත් කරන ලද 2024.03.09 දිනැති දෙපාර්තමේන්තු නියෝග 01/2024 කෙරෙහි ඔබේ කාරුණික අවධානය යොමු කරවමි.

02. එම නියෝගයෙහි 14.(අ) සහ (ආ) ඡේද, 2024.05.29 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2024 අනුව පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

**අමාත්‍යාංශ ලේකම් (ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා)**

<table>
<tr><th>හානි සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට බලය ලත් නිලධාරියා</th><th>මු.රෙ. අංකය</th><th>හානිය පිළිබඳ විස්තර</th><th>පැවති මූල්‍ය සීමාව (රු.)</th><th>සංශෝධිත මූල්‍ය සීමාව (රු.)</th></tr>
<tr><td rowspan="5">ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා</td><td>මු.රෙ. 108 (1) අ</td><td>සාමාන්‍ය අපතය (සාමාන්‍ය වියලීම හා හැකිලීම, වාෂ්පවීම හා නරක් වීම යනාදිය)</td><td colspan="2">භාණ්ඩාගාරය විසින් නියම කරනු ලැබූ ප්‍රතිශතයන් ඇතුළත</td></tr>
<tr><td>මු.රෙ. 108 (1) ආ</td><td>මුහුදේදී හෝ ගුවනේදී සිදුවන හානි</td><td rowspan="2">5,000,000.00</td><td rowspan="2">7,000,000.00</td></tr>
<tr><td>මු.රෙ. 108 (1) ඇ</td><td>වෙළඳුන්, නැව්ගත කරන්නන්, නැව් සමාගම් නියෝජිතයන් හෝ බඩු ගොඩබාන සමාගම් යන මේවායේ කොන්ත්‍රාත්තු ගිවිසුම් පැහැර හැරීම තුළින් ඇතිවන හානි</td></tr>
<tr><td>මු.රෙ. 108 (1)(i)</td><td>මු.රෙ. 105(1) ප්‍රකාර</td><td>2,000,000.00</td><td>3,000,000.00</td></tr>
<tr><td>මු.රෙ. 108 (1)(ii)</td><td>වංචාවක් හෝ පවතින ක්‍රමයේ දෝෂයක් හෝ නොමැති කල්හි</td><td>5,000,000.00</td><td>7,000,000.00</td></tr>
</table>

**අධ්‍යක්ෂ ජනරාල් (ගණන්දීමේ නිලධාරියා)**

<table>
<tr><th>හානි සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට බලය ලත් නිලධාරියා</th><th>හානිය පිළිබඳ විස්තර</th><th>පැවති මූල්‍ය සීමාව (රු.)</th><th>සංශෝධිත මූල්‍ය සීමාව (රු.)</th></tr>
<tr><td rowspan="3">ගණන්දීමේ නිලධාරියා</td><td colspan="3">(අ) 104(2), 104(2)(අ), (ආ) හා (ඇ) යටතේ වාර්තා කිරීම අවශ්‍ය නොවන හානි සම්බන්ධයෙන් කටයුතු කළ හැකිය.</td></tr>
<tr><td>මු.රෙ. 104 (2) ප්‍රකාර</td><td>50,000.00</td><td>750,000.00</td></tr>
<tr><td>මු.රෙ. 104(2) (අ) ප්‍රකාර</td><td>500.00</td><td>25,000.00</td></tr>
</table>

| | | | |
|---|---|---|---|
| | මු.රෙ. 104(2) (ආ) ප්‍රකාර | 500.00 | 25,000.00 |
| | මු.රෙ. 104 (2) (ඇ) ප්‍රකාර<br>(i) මුදල්, ප්‍රවේශ පත්‍ර, මුද්දර ආදිය පිළිබඳ දිනපතා හරි වැරදි බැලීමක් කෙරෙන අවස්ථාවලදී<br>(ii) දිනපතා හරි වැරදි බැලීමක් නොකෙරෙන අවස්ථාවලදී | <br>250.00<br><br>25.00 | <br>25,000.00<br><br>15,000.00 |
| | මු.රෙ. 105(1) ප්‍රකාරව | 250,000.00 | 500,000.00 |

මීට අමතරව පහත කරුණු කෙරෙහිද අවධානය යොමු කළ යුතු වේ.

03. හානිපාඩු හෝ අලාභහානි සම්බන්ධයෙන් මු.රෙ. 104(4) යටතේ අලාභයන් පිළිබඳ පූර්ණ වාර්තාව දින 07ක් තුළ ලබාදිය නොහැකි නම්, මු.රෙ. 104(3) යටතේ පරීක්ෂණ කමිටු වාර්තාව සහ අලාභයන් පිළිබඳ ප්‍රාරම්භක වාර්තාව (පොදු ආකෘති 283) පිටපත් 04 කින් ඉදිරිපත් කළ යුතු අතර මාස 03ක් තුළ මු.රෙ. 104(4) යටතේ පරීක්ෂණ කමිටු වාර්තාව සහ අලාභයන් පිළිබඳ අවසාන වාර්තා (පොදු ආකෘති 284) පිටපත් 04 කින් ඉදිරිපත් කිරීමෙන් අනතුරුව මු.රෙ. 109 යටතේ අලාභයන් පොතෙන් කපාහැරීමෙ ඉල්ලුම්පත් සම්පූර්ණ කළ යුතු වේ.

04. මේ වන විට කටයුතු කර නොමැති හානි පාඩු සම්බන්ධයෙන් සියලු කටයුතු 2024.12.31 දිනට ප්‍රථම අවසන් කිරීමට පියවර ගත යුතුවේ.

05. එමෙන්ම පාඩු හා අලාභහානි සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී ඒ සම්බන්ධයෙන් නිකුත්කර ඇති 2024.05.29 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2024 කෙරෙහිද ඔබේ අවධානය යොමු කරන මෙන් වැඩිදුරටත් දන්වා සිටිමි.

06. හානි පාඩු සම්බන්ධ සිද්ධීන් සඳහා පත්කරන ලද මු.රෙ. 104(4) පරීක්ෂණ කමිටු වල නිලධාරීන් විසින් කමිටුවෙන් ඉල්ලා අස්වීම සම්බන්ධයෙන් කරනු ලබන ඉල්ලීම් මින් ඉදිරියට සලකා නොබලන අතර ඒ පිළිබඳ විනයානුකූලව කටයුතු කිරීමට සිදුවන බවද කාරුණිකව දැනුම් දෙමි.

ආචාර්ය කේ.ඒ.සී.එච්.ඒ. කොතලාවල
අධ්‍යක්ෂ ජනරාල්
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

පිටපත්:

1. ලේකම්, කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය -කරු. දැ.ගැ.ස.
2. විගණකාධිපති -කරු. දැ.ගැ.ස.
3. ප්‍රධාන අභ්‍යන්තර විගණක -කරු. දැ.ගැ.ස.